## රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව

## සෞඛ්‍ය අමාත්‍යාංශයට II ශ්‍රේණියේ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් බඳවා ගැනීම - 2020

ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ දන්ත වෛද්‍ය නිලධාරි (II ශ්‍රේණිය) තනතුරේ පවත්නා පුරප්පාඩු 138 න් සේවා අවශ්‍යතාව මත හඳුනාගත් තනතුරු 87 ක් සඳහා බඳවා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියෝගය පරිදි සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මෙහි 04 වන ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරන අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ පළකර ඇති අනුයුක්ත කිරීම සඳහා වූ පුරප්පාඩු ලේඛනය හා අභිමතය ප්‍රකාශ කිරීමේ ආකෘතිය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් භාර ගැනීම **2020.09.22 වැනි දින පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ ශ්‍රවණාගාරය හි දී සිදු කෙරේ. එදින පෙ.ව. 9.00 සිට ප.ව. 12.00 දක්වා දන්ත සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සාමාජිකයන් එම ස්ථානයේදී ඔබගේ සහතික පත්‍ර පරීක්ෂා කිරීම සහ සේවා ස්ථාන සඳහා මනාප සළකුණු කිරීම සඳහා ඔබට සහය වනු ඇත. වැඩිදුර විස්තර සඳහා දුරකථන අංක 0112-692846 මගින් අධ්‍යක්ෂ (දන්ත සේවා) කාර්යාලයෙන් විමසීම් කළ හැක.**

02. *මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය* - රා.පරි. චක්‍රලේඛ අංක 03/2016 අනුව මාසිකව, රු. 52,955 - 645 x 4 - 1,335 x 3 - 1,345 x 7 -1,630 x 2 - 2,170 x 16 - රු. 104,355 (SL - 2-2016) මෙයට අමතරව රාජ්‍ය හා දෙපාර්තමේන්තු චක්‍රලේඛ වලින් සපයා ඇති ප්‍රතිපාදන අනුව ගෙවන දීමනා ද ඇතුළත් වේ. කෙසේ වුවද, ඔබ විසින් මෙම වැටුප් පරිමාණයේ 04 වන වැටුප් පියවරට එළඹීමට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

03. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුවේ. තවද, ඔබගේ පත්වීම, පත්වීම ලද දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ය. රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝගවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද රජය විසින් කලින් කලට නිකුත් කරනු ලබන රෙගුලාසිවලට සහ නියෝගවලට ද ඔබගේ පත්වීම යටත්ය. තවද පත්වීම ලද දිනයේ සිට වසර 5ක් ඉකුත් වීමට පෙර 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි විධිවිධාන අනුව රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ඔබ විසින් ලබාගත යුතු අතර එසේ නැතහොත් වැටුප් වර්ධක අත්හිටුවනු ඇත.

04. මෙම පත්වීම සඳහා බඳවා ගැනීමට කුසලතා ලේඛනය සකස් වන්නේ පේරාදෙණිය දන්ත වෛද්‍ය පීඨයේ දන්ත වෛද්‍යවේදී උපාධිය ලත් දන්ත ශල්‍ය වෛද්‍යවරුන් එම පීඨයෙන් නිකුත් කළ කුසලතා ලේඛනයට අනුකූලව සහ විදේශ දන්ත ශල්‍ය වෛද්‍ය උපාධිය ලබාගත් අයවලුන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලබාදෙන කුසලතා අනුපිළිවෙළ අනුව අදාළ කණ්ඩායම් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ අංක HSC/APP/DEN/01/01/2020 හා 2020.06.11 දිනැති ලිපිය මගින් ලබාදුන් අනුපිළිවෙලට අනුවය.

05. උපාධිධාරීන්ගේ අයදුම්පත් කුසලතා ලේඛනයේ අනුපිළිවෙලට අනුව සලකා බලනු ලැබේ.

06. ඉල්ලුම්කරුවන් පහත සඳහන් ලියවිලිවල පිටපත් ස්වකීය ඉල්ලුම් පත්‍රවලට අමුණා ඉදිරිපත් කළ යුතු අතර 2020.09.22 වැනි දින පරීක්ෂා කිරීම සඳහා මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(*අ*) නිසි පරිදි පුරවා අත්සන් කොට සහතික කරන ලද අයදුම්පත හා අභිමතය පළ කිරීමේ ආකෘති පත්‍රය,
(*ආ*) උප්පැන්න සහතිකයේ පිටපත් තුනක් (03),
(*ඇ*) ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකයේ පිටපත් තුනක් (03),
(*ඈ*) ජාතික හැඳුනුම්පතේ දෙපසම දැක්වෙන පරිදි ලබා ගත් ඡායා පිටපත් තුනක් (03).

07. කුසලතා ලේඛනය, පුරප්පාඩු ලේඛනය, දන්ත ශල්‍ය වෛද්‍යවරුන් බඳවා ගැනීමේ නිවේදනය හා අභිමත ප්‍රකාශ කිරීමේ ආකෘති පත්‍රය අයදුම්කරුවන් හට www.health.gov.lk වෙබ් අඩවියට පිවිස හෝ අධ්‍යක්ෂ (දන්ත සේවා) කාර්යාලයෙන් ලබා ගත හැක.

08. අභිමතය ප්‍රකාශ කිරීමේ ආකෘති පත්‍රයේ කැමති සේවා ස්ථානය ලකුණු කිරීමේදී තම කුසලතා අංකයට සමාන හෝ වැඩිදුර වරනයක් දක්වා එවන ලෙසට සියලුම අයදුම්කරුවන්ට මෙයින් උපදෙස් දෙනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව අනුමැතිය පරිදි,

ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

09-218

Source: Government Gazette (2020.09.04)